# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 29 දරන
# මුද්දර ගාස්තු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ජූලි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිළ : ශත 75 යි. | තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 29 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජූලි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 88/92

**1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1993 අංක 29 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 27 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1982 අංක 43 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (20අ) සහ (20ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(20අ) යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක හෝ 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද කොටස් සහතිකය ;

(20ආ) යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක හෝ 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක් පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය ;

(20ඇ) යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක යම් පරිවර්තනය කළ හැකි සෘණපත්‍ර හෝ වෙනත් පරිවර්තනය කළ හැකි සුරැකුම්පත් වෙනුවෙන් නිකුත් කරනු ලබන අවස්ථාවෝචිත පරිදි, පරිවර්තනය කළ හැකි සෘණපත්‍ර සහතිකයක් හෝ අමාත්‍යවරයා විසින් නිශ්චිත කළ යුතු සමාන ස්වභාවයක වූ වෙනත් යම් සාධන පත්‍රයක් සහ ඒ සෘණපත්‍ර හෝ වෙනත් පරිවර්තනය කළ හැකි සුරැකුම්පත් පැවරීම පිණිස ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක්, අදාළ නිකුතුව හෝ පැවරුම 1993 අප්‍රේල් මස 21 වන දින හෝ ඊට පසුව කරනු ලබන්නේ නම් ;" සහ

(2) ඒ වගන්තියේ (22) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(23) වර්ෂ හතරකට නොඅඩු කාලසීමාවක් සඳහා 1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව නිකුත් කරනු ලැබ ඇත්තා වූ සහ ඒ කාලසීමාව ඉකුත් වීමට පෙරාතුව යම් අවස්ථාවක දී මුදල් කරනු

ලැබ නොමැත්තා වූ (තැන්පතුකරුගේ හෝ ඔහුගේ නාමිකයාගේ නම දරන යම් සහතිකයක් නොවන) තැන්පතු සහතිකය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "චෙක්පතක් හෝ පොරොන්දු නෝට්ටුවක්." යන වචන වෙනුවට "චෙක් පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) මේ පනතේ 5 වන වගන්තියේ (23) වන ඡේදයේ සඳහන් වන්නා වූ ද, එහි සඳහන් කාලසීමාව ඉකුත් වීමට පූර්වයෙන් මුදල් කරනු ලැබ එසේ මුදල් කරනු ලැබූ දිනයේ දී මුද්දර ගසනු ලැබුවා වූ ද තැන්පතු සහතිකයක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1991 අංක 27 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) ස්වකීය සමාගමේ කොටස්කරුවන්ට ප්‍රති යුක්ත ආකෘති පත්‍ර සපයන යම් සමාගම කට ;" ;

(ආ) "ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ සෑණ ස්කන්ධ වෙනුවෙන් හෝ" යන වචන වෙනුවට "ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන හෝ ඇති කරන ලද කොටස් හෝ සෑණ ස්කන්ධ වෙනුවෙන් හෝ ඒ සමාගම විසින් සපයන ලද ප්‍රතියුක්ත ආකෘති පත්‍ර වෙනුවෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (ii) වන ඡේදයේ "ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ සෑණ ස්කන්ධ පිළිබඳ හෝ" යන වචන වෙනුවට, "ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන හෝ ඇති කරනු ලබන කොටස් හෝ සෑණ ස්කන්ධ පිළිබඳ හෝ ඒ සමාගම විසින් සප යන ලද ප්‍රතියුක්ත ආකෘති පත්‍ර පිළිබඳ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (iii) වන ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආආ) ඒ සමාගම විසින් කොටස්කරුවන් වෙත සපයනු ලබන ප්‍රතියුක්ත ආකෘති පත්‍ර වෙනුවෙන් ;" සහ

(ඉ) "මේ උපවගන්තියේ කාර්ය සඳහා" යන වචනවල සිට එහි අවසානය දක්වා කොටස අත්හැරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

"(ii) සෑම බැංකුවක්, අනුමත ණය දෙන නියෝජනායතනයක් හෝ ආයතනයක් ම විසින් නිකුත් කරනු ලබන (චෙක්පතක් නොවන) සෑම විනිමය පත්‍රයක් ම, පොරොන්දු නෝට්ටුවක් ම, භාර කුවිතාන්සියක් ම, භාර ලිපියක් ම හෝ භාර ප්‍රකාශයක් ම වෙනුවෙන් ද ඊට කරන ලද ද්‍රව්‍යමය චංචල දේපළ සම්බන්ධ සෑම ඔඩපතයක් ම වෙනුවෙන් ද ණය වර ලිපියක් සඳහා ඊට ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමක් ම වෙනුවෙන් ද එය විසින් නිකුත් කරන ලද සෑම තැන්පතු සහතිකයක්ම වෙනුවෙන් ද (එය සමග ණයවර ලිපියක් ආරම්භ කර නොමැති යම් ද්‍රව්‍යමය චංචල දේපළක් වන) යම් ද්‍රව්‍යමය චංචල් දේපළක් සම්බන්ධයෙන් එය වෙත ඉදිරිපත් කරන ලද යම් ගෙවීමේ ලේඛන අතුරින් යම් එක් ලේඛනයක් වෙනුවෙන් ද ගෙවිය යුතු මුද්දර ගාස්තුව ඒ බැංකුව, ණය දෙන නියෝජනායතනය හෝ ආයතනය විසින් අයකර ගත යුතුය.";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (චෙක්පතක් නොවන) සෑම විනිමය බිල් පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක්, භාර කුවිතාන්සියක්, භාර ලිපියක්, භාර ප්‍රකාශයක්, ද්‍රව්‍යමය චංචල දේපළ සම්බන්ධයෙන් වූ ඔඩපතය කිරීමක් හෝ ණයවර ලිපියක් සඳහා කරන ලද ඉල්ලීමක් හෝ තැන්පතු සහතිකයක් හෝ (එය සමග ණයවර ලිපියක් ආරම්භ කර නොමැති යම් ද්‍රව්‍යමය චංචල දේපළක් වන) යම් ද්‍රව්‍යමය චංචල දේපළක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යම් ගෙවීමේ ලේඛන අතුරින් යම් එක් ලේඛනයක් වෙනුවෙන් ද අය කළ යුතු මුද්දර ගාස්තුව ගෙවීම, අවස්ථාවෝචිත පරිදි මේ වගන්තියට අනුකූලව ගෙවීම සඳහා එකතුකර ගෙන ඇති හෝ එකතුකර ද්‍රෝෂණය කර ඇති අවස්ථා වක, අවස්ථාවෝචිත පරිදි (චෙක්පතක් නොවන) ඒ විනිමය බිල්පත්‍රය, පොරොන්දු නෝට්ටුව, භාර

කුවිතාන්සිය, භාර ලිපිය, භාර ප්‍රකාශය, ද්‍රව්‍යමය චංචල දේපළ සම්බන්ධයෙන්වූ ඔබපනය හෝ ණය වර ලිපිය සඳහා කරන ලද ඉල්ලීම හෝ නැන්පතු සහතිකය හෝ ගෙවීමේ ලේඛනය වෙනුවෙන් මුද්දර ගාස්තුව ගෙවීම සඳහා එකතු කර ඇති බවට හෝ එකතුකර ප්‍රේෂණය කර ඇති බවට අවස්ථාවෝචිත පරිදි, ඒ සමාගම විසින් හෝ බැංකුව විසින් හෝ අනුමත නියෝජ්‍යායතනය විසින් හෝ ආයතනය විසින් හෝ ඒ මත සහතික කළ යුතු ය. ඒ සහතිකය පහත දැක්වෙන ආකෘතියට සාරානු කූල විය යුතු ය :—

'මේ සාධන පත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව වන රුපියල් ........................ මුද්දර ගාස්තු පනතේ 13 වන වගන්තිය ප්‍රකාර ගෙවීම සඳහා එකතුකර ගන්නා ලද බව හෝ එකතුකර ප්‍රේෂණය කර ඇති බව මෙයින් සහතික කරනු ලැබේ.' ; " ;

(4) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ " ගෙවීම ඉහත කී පරිදි එකතු කරනු ලැබ තිබුණ ද," යන වචන වෙනුවට " ගෙවීම ඉහත කී පරිදි එකතුකර හෝ එකතුකර ප්‍රේෂණය කරනු ලැබ තිබුණ ද," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (7) මේ වගන්තියේ කාර්ය සඳහා " ආයතනය " යන්නෙන් මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංචාරක චෙක්පත් මුදල් කිරීම සඳහා හෝ තැන්පතු සහතික නිකුත් කිරීම සඳහා බලය දෙන ලද යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (2) වන උප වගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2) 13 වන වගන්තිය යටතේ එකතු කර ගෙවීම සඳහා බලය දී ඇති හෝ එකතු කර ප්‍රේෂණය කිරීම සඳහා නියම කර ඇති බද්ද ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන යම් කාලසීමා අවසානයේ දී හෝ ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ ඒ එක් එක් කාර්තුව අවසානයේ දී හෝ ප්‍රේෂණය කරනු නොලැබූ අවස්ථාවක, ඒ බද්ද සහ ඒ බද්ද ගෙවීම් නොකළ සෑම මාසයක් වෙනුවෙන්ම එම බද්දෙන් සියයට අනයකට සමාන දණ්ඩන මුදලක්ද සමග, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ බද්ද එකතු කර ගෙවීම සඳහා එසේ බලය දෙනු ලැබ හෝ එකත කර ප්‍රේෂණය කිරීම සඳහා

එසේ නියම කරනු ලැබ ඇති තැනැත්තා ගෙවීම් පැහැර හැර ඇති තැනැත්තෙක් ලෙස, මේ පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර හැර ඇති බදු මුදලෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය. ".

6. 1991 අංක 27 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) " පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර සඳහා ඔහු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී දීමනාවක් දිය හැකි ය :—" යන වචන වෙනුවට " පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර සඳහා හෝ මුද්දර ඇලවීමෙන් තොරව වෙනත් යම් ආකාරයකින් මුද්දර ගාස්තුව ගෙවා ඇති අවස්ථාවක හෝ ඔහු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී දීමනාවක් දිය හැකි ය :— " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඉ) ඡේදයේ " පාවිච්චි නොකරන ලද අවස්ථාවක. " යන වචන වෙනුවට " පාවිච්චි නොකරන ලද අවස්ථාවක ; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

" (ඊ) යම් ණයවර ලිපියක් සඳහා කරන ලද යථා පරිදි මුද්දර ගසන ලද ඉල්ලීමක් අනුව නිකුත් කරන ලද ණයවර ලිපියක් අර්ධ වශයෙන් පාවිච්චි කරන ලද අවස්ථාවක දෙනු ලබන දීමනාව ඒ ණයවර ලිපියේ පාවිච්චියට ගනු නොලැබූ වටිනාකමෙහි ඒ කොටසට ආරෝපණය කරනු ලැබිය හැකි පරිදි වූ ගෙවන ලද මුද්දර ගාස්තුවේ කොටස සඳහා විය යුතු ය ; ";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර මිල දී ගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. " යන වචන වෙනුවට " අවස්ථාවෝචිත පරිදි පාවිච්චි නොකරන ලද හෝ නරක් වූ මුද්දර මිල දී ගත් දින සිට හෝ මුද්දර ගාස්තු ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) (1) වන උපවගන්තිය යටතේ දීමනාවක් සඳහා වූ ඉල්ලීමක් මත කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) මුද්දර පාවිච්චි කරනු නොලැබූ හෝ හරක් වූ අවස්ථාවක—

(i) එම වර්ගයේ හා වටිනාකම ඇති වෙනත් මුද්දර, හෝ

(ii) මුද්දර වටිනාකමෙන් සියයට පහක් අඩු කිරීමෙන් පසුව මුදලින් හෝ මුදල් ගෙවීමට නියමයක් මගින්, හෝ

ඉල්ලුම්කරුට දෙනු ලැබිය හැකි ය ; හෝ

(ආ) මුද්දර ඇලවීමෙන් තොරව වෙනත් ආකාරයකින් මුද්දර ගාස්තුව ගෙවා ඇති අවස්ථාවක ගෙවන ලද මුද්දර ගාස්තුව එසේ ගෙවන ලද මුද්දර ගාස්තුවෙන් සියයට පහක් අඩු කිරීමෙන් පසුව ආපසු ගෙවිය හැකි ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.**

7. 1991 අංක 27 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "ලේඛනය" යන්නෙහි අර්ථ කථනයේ (අ) ඡේදයේ "කැඳවීම් නියෝගයක් සහ මෝසමක් නොවන වෙනත් ඉල්ලීමක්, ප්‍රශ්න මාලාවක්" යන වචන වෙනුවට "කැඳවීම් නියෝගයක්, මෝසමක් නොවන ඉල්ලීමක්, ප්‍රශ්න මාලාවක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

**අතීතයට බලපෑම.**

8. මේ පනතේ 6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියට කරන ලද සංශෝධන, 1986 නොවැම්බර් මස 12 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර මේ පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත 54 වන වගන්තිය යටතේ දීමනාවක් සඳහා ඉල්ලීමක් කිරීමට හිමිකම ඇත්තා වූ සෑම තැනැත්තකු ම මේ පනත ආරම්භවීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත ඔහු විසින් ඒ ඉල්ලීම කරනු ලැබුවහොත් ඒ වගන්තියේ (2) වන උපවගන්තිය අනුව නියමිතු කරනු ලැබ ඇත්තාක් සේ සලකනු ලැබිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි, කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.